# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2110/53 - 2019 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2019.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### තැපැල් දෙපාර්තමේන්තුව

### තැපැල් කාර්යාල ආඥාපනත

**තැපැල් කාර්යාල ආඥාපනතේ (190 වැනි අධිකාරිය) 8(1) (ඕ) වැනි වගන්තිය යටතේ තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන නිදහස් තැපැල් පහසුකම් වලට අදාළ මුද්දර වටිනාකම වැඩි කිරීම හා ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ලබා දෙන නිදහස් තැපැල් පහසුකම් ප්‍රතිපාදන වැඩි කිරීම 2018.01.16 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අංක අමප/18/0017/743/001 අනුව අනුමත කරන ලදී. ඒ අනුව,

1. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිදහස් තැපැල් පහසුකම් සඳහා වසරකට ලබාදී ඇති රු. 175,000/- ක සීමාව රු. 350,000/- ක් දක්වා සංශෝධනය කිරීම.

2. ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ නිදහස් තැපැල් පහසුකම් සඳහා වසරකට ලබා දී ඇති රු. 24,000/- ක සීමාව රු. 48,000/- ක් දක්වා සංශෝධනය කිරීම.

මෙම නියෝග 2018.01.16 දින සිට ක්‍රියාත්මක විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

එම්. එච්. ඒ. හලීම්,
තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය.

2019 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ.

03- 209


1A - PG 4390 — 767 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*